උතුරු මෙල්බර්නයට අලුත් අවුරුදු

උතුරු වික්ටෝරියානු ශ්‍රී ලංකා සුබසාධක සංගමය හිතවතුන් රැසක් එක් කර ගනිමින් හියුම් නගරසභාව සහ අනුග්‍රාහක ආයතන රැසක් සමග සංවිධානය කළ සිංහල සහ දමිල අලුත් අවුරුදු උළෙල අප්‍රේල් 24 වන ඉරිදා පෙරවරු 10 සිට ක්‍රේගිබර්න් හිදී අති සාර්ථකන අන්දමින් පැවැත්වුණි. වික්ටෝරියානු පාර්ලිමේන්තු මන්ත්‍රිනි ලිස් බීටි මෙල්බන්හි ශ්‍රී ලංකා කොන්සල් බන්දු දිසානායක ඇතුළු සම්භාවණීය අමුත්තන් රැසකගේ සහභාගිත්වයෙන් පැවැත්වුණ මේ උළෙල සංවිධානය කිරීම සඳහා මහත් කැපවීමක් කළ දයාසෝම බමුනුසිංහ මහතා සමග සන්තසය කළ පිළිසඳරකි මේ.

අති සාර්ථක ශ්‍රී ලාංකික අවුරුදු උළෙලක් අවසන් කිරීමෙන් පසු දැන් ඔබට ඒ ගැන ඇත්තෙ මොන වගේ හැඟීමක්ද?

මුලින්ම මට ඇති.වෙන්නෙ විශාල සතුටක් සහ තෘප්තියක්. මොකද මේ උළෙල සංවිදානය කිරීමම අපට විහාල අභියෝගයක් වුණ නිසා. මුලින්ම මම ස්තුතිවන්ත වෙන්න ඕනෙ මේ කාර්යයට මා එක්ක අත්වැල් බැඳ ගත් හිතවතුන් හා හිතවතියන් ට. උතුරු වික්ටෝරියා ප්‍රදේශයේ සංවිදාන ගණනාවකට අයත් හිතවතුන් පිරිසක් ඉතා කැපවී-මෙන් මේ උළෙල සංවිධානය කරන්න මගන්සි වුණා. ඒ අයගේ කැපවීමේ ප්‍රතිඵලය දිහා ආපසු හැරිලා බලනකොට මට විශාල සතුටක් ඇතිවෙනවා. මම දන්නවා අප හා එක්ව මේ විශාල කාර්යය කළ කන්ඩායමේ සියලු දෙනා තුළම ඒ සතුට ඇති බව.

මේක සංවිධානය කරන විට ඔබට මුහුණ දෙන්න වුණේ මොන වගේ අභියෝග වලටද?

අපට මුහුණ දෙන්න සිදුවුණ පළමු අභියෝගය

තමයි අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා ගැනීම. මෙහිදී අපට වික්ටෝරියානු රජයෙන් ඩොලර් 1000 ක ආධාරයක් ලැබුණා. ඉතිරි මුදල් අපට ලබා දුන්නේ උතුරු වික්ටෝරියා ප්‍රදේශයේ ශ්‍රී ලාංකික සහ අනෙක් ව්‍යාපාරික ප්‍රජාව. ඔවුන් ගේ සහය නොලැබෙන්න මේ උළෙල මේ ආකාරයට සංවිධානය කරන්න අපට නොහැකි වෙන්න ඉඩ තිබුණා. ඒ ගැන ඔවුන්ට අපි ස්තුති කරනවා.

අවුරුදු උළෙල පැවැත්වූ දැකුම්කලු ක්‍රීඩාංගනය අවශ්‍ය උපකරණ ආරක්ෂක නිලධාරීන් සහ අනෙකුත් සියලු පහසුකම් අපට ලබා දුන්නේ හියුම් නගරසභාවයි. උළෙල සහභාගිවුණ අපේ හිතවතුන් අකින්න ඇති මේ ක්‍රීඩාංගනය අපේ අවුරුදු උළෙල කොයි තරම් හොඳට ගැළපුණාද කියන එක. මේ සහයෝගය වෙනුවෙන් හියුම් නගරාධිපතිනිය උපනගරාධිපතිනිය සහ ප්‍රධාන විධායක නිලධාරි මහත්ම මහත්මීන්ට ස්තුති කරන්න කැමතියි.

ඒ වගේම අපේ ප්‍රජාවගෙන් ලැබුණ සහයෝගයත් වචන වලින් කියන්න බැරි තරම් විශාලයි.

මෙවන් උත්සවයක් සංවිධානය කරන විට විවිධ බාධක මතුවීම ස්වභාවිකයි. ඔබ මේවාට මුහුණ දුන්නෙ කොහොමද?

පළමුව කියන්න ඕනෙ අපි මේ උළෙල සංවිදානය කළේ කන්ඩායමක් හැටියට. ගණනින් ඉතා කුඩා සංඛ්‍යාවක් වුණත් අපේ කණ්ඩායමේ හැම දෙනාම දැඩි කැපවීමකින් කටයුතු කළ නිසා සියලු බාධක මැඩ ඉදිරියටම යන්න අපට පුලුවන් වුණා. අපට බාධක නොතිබුණා නෙවෙයි. ඒත් අපේ කණ්ඩායම ඒ කිසිවකින් අධෛර්ය වන කණ්ඩායමක් නො-වෙයි.

අපි මුලින්ම මේ උත්සවය පවත්වන්න හිටියෙ අප්‍රේල් 3 වන දා. නමුත් ඒ අවස්ථාවෙදි අවශ්‍ය අරමුදල් සඳහා ඉල්ලුම් කරන්නට අපටත් හියුම් කවුන්සිලයටත් නොහැකි වුණා. ඒ නිසා ඒ දිනයේදි උත්සවය පවත්වන්න අපට නොහැකි වුණා. නමුත් පසුව අපි තීරණය කළා ඒ අරමුදල නොලැබුණත් මේ උත්සවය අප්‍රේල් 24 වන දින පවත්වන්නට.

අපි පැහැදිලිවම කියන්න ඕනෙ මේ උත්සවයෙන් අපි කිසිම ලාබයක් නොලැබූ බව. මේ උත්සවයේ මුදල් පාලනය ඉතාම විවෘතයි. ඕනෑම කෙනෙකුට අපේ භාණ්ඩාගාරික අරුණ විජේතුංග මහතාගෙන් (දුරකතන 0419 365 113) ඒ සියලුම විස්තර ලබා ගන්න පුලුවන්.

මේ තරම් ජනකායක් සහභාගිවේ යයි ඔබ බලාපොරොත්තු වුණා ද?

අපේ ගණන් බැලීම අනුව දෙදහසක පමණ පිරිස-ක් සහභාගි වුණා. අලුතෙන්ම පටන් ගත් අවුරුදු උත්සවයක් වෙනුවෙන් මේ තරම් විහැදාල පිරිසක් සහබාගිවුණ පළමු වතාව මේක බවයි පැමිණි වැඩිහිටි පිරිසගේ අදහස වුණේ. සති තුනක් වැනි කෙටි කාලයකදී සංවිධානය කළ මේ උළෙලට මේ තරම් ජන සහභාගිත්වයක් ලැබීම විහාල ජයග(හණයක්. ඒක අපට විශාල ශක්තියක්.

මේ උළෙලේ අපි දුටු විශේෂම දෙයක් තමයි දමිල ජනතාවගේ සහභාගිත්වය. එක්සත් ශ්‍රී ලංකාවක් වෙනුවෙන් ඇතිනාලම දැනෙන මේ වගකිවයුතුවේ දමිල ජනතාවත් සිංහල ජනතාවත් එක නැතකට රැස් කළ එක ඉතා වැදගත් දෙයක් කියලයි අපට හිතෙන්නෙ. මේ ගැන ඔබේ අදහස දැනගන්න කැමතියි.

ඇත්තටම අපේ ශ්‍රී ලාංකික ප්‍රජා වැඩ කටයුතු වලට සහභාගි වන විට බොහෝ විට මට දැනුණ දෙයක් තමයි අපේ කටයුතු වලදී සියලුම ශ්‍රී ලාංකිකයන් නියෝජනය වන්නේ නැහැ නේද කියන එක. ශ්‍රී ලාංකික අලුත් අවුරුද්ද කියන්නෙ සිංහල හා දමිල ජන කොට්ඨාශ දෙකටම පොදු උළෙලක්. ඒ නිසා මේ ජන කොටස් දෙකම මෙයට සහභාගි කරගැනීමේ බලවත් අපේක්ෂාවක් අපට තිබුණා. මේ සඳහා අපේ ශාන්තලිංගම් සෙල්වනායගම් මුරුගන් පූජපති ඇතුළු අපේ දමිල සහෝදරයන් ගණනාවක් අප සමග අත්වැල් බැඳ ගත්තා. මේ බැඳීම ඉදිරියටත් පවත්වාගෙන යා යුතුය කියන එක තමයි අපේ මතය.

උදේ සිට සවස් වන තුරු සහභාගිවන සැමටම විවෘතව තිබුණ අවුරුදු කෑම මේසයේ මෙල්බන් හි පළමු වතාවට සිංහල සහ දමිල කැවිලි වර්ග ගොඩ ගසා තිබෙනු ඔබත් දකින්න ඇතී.

ඒ එක්කම අපේ මුස්ලිම් බර්ගර් සහෝදර ජනතාවත් මේ උත්සවයට සහභාගි වුණා. ඒ ඇරෙන්නට ඔස්ට්‍රේලියානු ජනතාවගේ සහභාගිත්වයත් අපට දැකගන්න පුලුවන් වුණා.

මීළඟ අවුරුදු උළෙලට ඔබේ කණ්ඩායමේ සූදානම කොහොමද?

අපේ ආරම්භක පියවර මේ ආකාරයට සාර්ථක වීම අපධ ශක්තියක්. අපි දැන් උත්සාහ කරන්නෙ උතුරු වික්ටෝරියා ප්‍රදේශයේ තිබෙන සියලුම ශ්‍රී ලාංකික සමිති සමාගම් එක්ක එක් වෙලා මිළඟ උත්සවය තවත් සාර්ථක කරගන්නටයි. මේ සඳහා විවිධ සමිති සමාගම් රැසක් මේ වන විටත් අපට සහයෝගය දෙන්න ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ සියලුම දෙනාගේ සහයෝගයත් අරගෙන අති සාර්ථක උත්සවයක් කිරීම තමයි අපේ බලාපො-රොත්තුව.

අපේ පළමු ශ්‍රී ලාංකික අවුරුදු උළෙල සාර්ථක කරගන්නට විවිධ අයුරින් අතහිත දුන් සැමටත් ප්‍රචාරක අනුග්‍රහය දැක්වූ සියලුම මාධ්‍ය ආයතන වලටත් අනුග්‍රහය දැක්වූ සියලුම ආයතන සහ හිතවතුන් සැමටත් සහභාගි වූ සැමටත් ස්තුති කරන්න අපි කැමතියි. මේ ලබාගත් අත්දැකීම් පදනම් කරගනිමින් තවත් ඉදිරියට යන්නට අපි සැම දෙනාම අත්වැල් බැඳ ගමු.